**යාපනය නගර සභාව**
**යාපනය දිස්ත්‍රික්කය**
**----------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**
**---------------**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**
**-------------------------------**

2018 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2019 මාර්තු 27 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ සම්පිණ්ඩන වාර්තාව 2019 ජුනි 30 දින විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2019 ඔක්තෝබර් 31 දින සභාපති වෙත ඉදිරිපත් කරන ලදී.

**1.2 තත්ත්වාගණනය කළ මතය**
**------------------------------**

මෙම වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2018 දෙසැම්බර් 31 දිනට යාපනය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නාවූ මතය වේ.

**1.3 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**
**------------------------------------------**

**(අ) ගිණුම්කරණ ප්‍රතිපත්ති**
**-------------------------**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යොදාගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතු වේ. | ඉදිරි වර්ෂවලදී ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කරනු ලැබේ. |

**(ආ) ගිණුම්කරණ අඩුපාඩු**
**-----------------------**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | සභාවට අයත් ඉඩම් හා ගොඩනැගිලි 51 ක වටිනාකම තක්සේරු කර මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි. | ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. | දේපල වටිනාකම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ii) | පළාත් පාලන සේවා නිලධාරීන්ගේ විශ්‍රාම වැටුප් හා විශ්‍රාම ප්‍රතිලාභ වෙනුවෙන් විශ්‍රාම වැටුප් | විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂවරයාට ගෙවිය යුතු බැරකම් ගිණුම්වල දැක්විය යුතුය. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

අධ්‍යක්ෂවරයාට සමාලෝචිත වර්ෂය දක්වා ගෙවිය යුතු රු.46,000,000 ක් විශ්‍රාම වැටුප් ගෙවිය යුතු ප්‍රමාණය වෙන්කර නොතිබූ අතර ගෙවිය යුතු වටිනාකම්ද බැරකම් ලෙස ගිණුම්වල හෙළිදරව් කර නොතිබුණි.

**(ඇ) නොසැසඳූ ගිණුම්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය අවසන් ගිණුම්වල පැවති ශේෂය හා ප්‍රධාන ලෙජරයේ ශේෂය අතර රු.2,089,342 ක වෙනස්කම් පැවතුණි. | අදාළ ශේෂවල පවතින වෙනස්කම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. | මෙවැනි දෝෂ සිදු නොවන අයුරින් ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. |

**1.4 අනුකූල නොවීම**

**1.4.1 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| (අ) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) උප වගන්තිය | වාර්ෂික කාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි. | අදාළ පනතේ විධිවිධානවලට අනුව කටයුතු කළ යුතු වේ. | පිළිතුරු ලබා දී නොමැත. |
| (ආ) | 1987 නගර සභා ආඥා පනතේ 42(අ) වගන්තිය | සභා බල ප්‍රදේශයේ පවතින අනවසර විදුලි සංදේශ කුළුණු ගොඩනැගිලි 11 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | අනවසර විදුලි සංදේශ කුළුණු 11 ක් සඳහා අවශ්‍ය අනුමැතීන් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | විදුලි සංදේශ ආයතන 11 න් අයකිරීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| (i) මුදල් රෙගුලාසි 371 | සභාව විසින් වර්ෂ 05 ක් ඉක්ම වූ රු.7,112,085 ක් වූ අත්තිකාරම් නිරවුල් කර නොතිබුණි. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | රු.7,112,085 ක් අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ii) මුදල් රෙගුලාසි 571 | වර්ෂ 02 කට අධික රු.3,321,931 ක් වටිනා විවිධ තැන්පතු සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. | නියමිත මුදල් රෙගුලාසිවලට අනුකූලව කටයුතු කළ යුතු වේ. | අදාළ කල් ඉකුත් වූ තැන්පතු ආදායමට මාරු කර ඇත. |
| (ඈ) 2002 නොවැම්බර් 28 දිනැති අංක IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපකරණ හා මෘදුකාංග ලේඛනගත කිරීම සඳහා වෙනම ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | භාණ්ඩාගාර චක්‍රලේඛවලට අනුව කටයුතු කළ යුතුය. | අනාගතයේදී ලේඛන නඩත්තු කිරීමට කටයුතු කරනු ලැබේ. |
| (ඉ) රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශයේ 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන චක්‍රලේඛය | සභාවේ වාහන 55 ක් සඳහා වර්ෂයකට අධික කාලයක සිට ඉන්ධන පරිභෝජන පරීක්ෂාවක් සිදුකර නොතිබුණි. | චක්‍ර ලේඛ උපදෙස් වලට අනුකූලව කටයුතු කල යුතුය. | ඉන්ධන පරිභෝජන පරීක්ෂාව සිදුකිරීමට කටයුතු කර ඇත. |

### 1.4.2 බදු අවශ්‍යතාවයන්ට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ 2002 වර්ෂයේ අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 20 වැනි වගන්තිය හා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.11 මාර්ගෝපදේශයේ සඳහන් කර ඇති ආකාරයට සමාලෝචිත වර්ෂයේ සැපයුම්කරුවෙකුට එකතු කළ අගය මත බදු ලෙස රු. 22,116,905 ක් ගෙවීම් කර තිබුණත් එම සැපයුම්කරුගෙන් “වැට් ඉන්වොයිසිය” (VAT Invoice) ලැබී නොතිබුණි. එසේම ගෙවා තිබූ එකතු කළ අගය මත බදු | අදාළ පනතට අනුව කටයුතු කළ යුතුය. | ඉදිරි කාලයේදී සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

| | | | |
|---|---|---|---|
| | පිළිබඳව, දේශිය ආදායම් දෙපාර්තමේන්තුවට හා විගණකාධිපතිට දැනුම් දී නොතිබුණි. | | |
| (ආ) | 1987 අංක 252 දරන මහනගර සභා පනතේ E අතුරු ව්‍යවස්ථා 247 වගන්තිය ප්‍රකාරව ඇතැම් ඉඩම් විකුණුම් මත 1% ක විකුණුම් බදු අයකළ යුතු වුවත් සභාව විසින් ඒවා අයකිරීමට කටයුතු කර නොතිබුණි. | මහනගර සභා පනත අනුව කටයුතු කළ යුතුය. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.158,007,827 ක් වූ අතර ඉකුත් වර්ෂය සමග සැසඳීමේ දී ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.231,451,523 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්,බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම්

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්,රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2018 | | | | 2017 | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ආදායම් ප්‍රභවය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 73,735,000 | - | 75,047,823 | 84,952,309 | 74,677,000 | - | 77,086,379 | 78,740,943 |
| කුලී | 222,235,000 | - | 83,775,696 | - | 103,932,000 | - | 101,762,393 | - |
| බලපත්‍ර ගාස්තු | 16,940,000 | - | 20,320,727 | - | 21,266,000 | - | 19,361,199 | - |
| වෙනත් ආදායම් | 787,090,000 | - | 693,738,951 | 247,703,448 | 665,125,000 | - | 683,780,574 | 260,474,339 |
| එකතුව | **1,100,000,000** | **-** | **872,883,197** | **332,655,757** | **865,000,000** | **-** | **881,990,545** | **339,215,282** |

### 2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2017 වර්ෂයේ රැස්කළ ආදායම රු.881,990,545 ක් වුවත්, 2018 වර්ෂයේ රැස්කළ ආදායම රු.872,883,197 කින් අඩු වී තිබීමෙන් 2017 වර්ෂය සමඟ සැසඳීමේදී 2018 වර්ෂයේ ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය රු.9,107,348 කින් අඩු වී තිබුණි. | බිල් කළ ආදායම් තහවුරු කළ යුතු වේ. | කඩ කාමර බදු දී නොමැති වීම නිසා ආදායම් අඩු වී තිබුණි. |

### 2.2.3 වරිපනම් හා බදු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| මහනගර සභාව වරිපනම් බදු අයකිරිම සඳහා “K” ආකෘති පත්‍ර 37,285 නිකුත් කළ යුතු වුවත් 38% ක් හෙවත් 14,023 ක් “K” ආකෘති පත්‍ර ලබා දී තිබුණි. මෙ නිසා වරිපනම් බදු සම්පූර්ණයෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව රු.84,952,309 ක් පමණක් ලැබී ඇත. | හිඟ හිටි මුදල් නියමිත කාලයේදී අයකර ගත යුතු වේ. | ඉඩම් හිමියන් විදේශ ගතව ඇති බැවින් හා හඳුනාගත නොහැකි වීමෙන් “K” ආකෘති පත්‍ර සම්පූර්ණයෙන් ලබා දිය නොහැකි වී ඇත. |

### 2.2.4 කඩකුලී

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- | --- |
| (අ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳපොල සංකීර්ණයේ පැවති කඩ කාමර 10 ක් ඇතුළුව කඩ කාමර හිඟ කුලී රු.4,866,365 ක් අයකර ගෙන නොතිබුණි. | සභාව විසින් හිඟ කඩ කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල හිඟ මුදලින් රු.2,594,672 ක් එකතු කිරීමට කටයුතු කර ඇත. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ බදු කුලී හිඟ රු.7,509,451 ක් මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | සභාව විසින් හිඟ බදු කුලී අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කර ඇත. |

### 2.2.5 බලපත්‍ර ගාස්තු

| විගණන නිරීක්ෂණ | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේ වෙළඳපොල බලපත්‍ර ගාස්තු රු.107,500 ක් හිඟ හිටව පැවතුණද මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ ව්‍යාපාර බලපත්‍ර ගාස්තු සහ ව්‍යාපාර බදු රු.752,757 ක් හිඟ හිටව පැවතුණද මේ දක්වා අයකර ගෙන නොතිබුණි. | හිඟ මුදල් අයකිරීමට කටයුතු කළ යුතු වේ. | හිඟ මුදල් අයකිරීමට ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

### 2.2.6 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම් සහ සියළුම බලධාරීන්ගෙන් 2018 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ මුදල් රු.8,137,500 ක් සහ මුද්දර ගාස්තු රු.94,406,730 ක් ලැබිය යුතුව තිබුණි. | හිඟ මුදල් ලබාගැනීමට කටයුතු කළ යුතු වේ. | පළාත් භාණ්ඩාගාරයේ ඉතිරි මුදල් අයකිරීමට කටයුතු කර ඇත. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්යසාධනය

මහනගර සභා ආඥා පනතේ 4 වැනි වගන්තිය අනුව, මහජන සෞඛ්‍යය, මහජන උපයෝගීතා සේවාවන් සහ පොදු මංමාවත් සහ මහජන සුවය පහසුකම් සහ සුභසාධනය ආදී සභාවෙන් ඉටුකළ යුතුව තිබූ කාර්යයන් ඉටුකිරීම සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

#### (අ) අතුරු ව්‍යවස්ථා

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| මහනගර සභාවේ අතුරු ව්‍යවස්ථාවේ 272 වගන්තිය ප්‍රකාරව මූලික කරුණු 30 ක් සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා ක්‍රියාත්මක කළ යුතු වුවත් | සඳහන් කළ සියලුම කරුණු ක්‍රියාත්මක කිරීමට අතුරු ව්‍යවස්ථා සකස් කිරීමට කටයුතු කළ යුතුය. | ක්‍රියාකාරකම් සිදුකිරීමට කටයුතු කරමින් පවතී. |

සියලුම කරුණු ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ආ) ක්‍රියාකාරී සැලැස්ම**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 30 ක් සම්බන්ධයෙන් ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර නොතිබුණි. | අතුරු ව්‍යවස්ථාවලට අනුකූලව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කළ යුතුය. | නිවැරදි ආකාරයෙන් ක්‍රියාකාරී සැලැස්ම සකස් කරනු ලැබේ. |

**(ඇ) ක්‍රියාකාරකම්වල කාර්යසාධනයේ ප්‍රමාදයන්**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සභාව විසින් ක්‍රියාත්මක කළ යුතුව තිබූ ක්‍රියාකාරකම් 06 ක් ප්‍රමාදයකින් පසුව ආරම්භ කර තිබුණි. | ක්‍රියාත්මක කළ යුතු ක්‍රියාකාරකම් අදාළ කාලවකවානු තුළ අවසන් කිරීමට කටයුතු කළ යුතු වේ. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**(ඇ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඝන අපද්‍රව්‍ය රැස්කිරීමේදී ආවරණය කළ වාහන භාවිතා නොකර විවෘත වාහනවලින් කසළ රැස්කරන බැවින් මාර්ගවල ගමන් කරන ජනතාව අපහසුතාවයට ලක්වී තිබුණි. | ආවරණය කළ වාහන භාවිතා කිරීම මගින් සෞඛ්‍ය ගැටළු වලක්වාලීමට කටයුතු කළ යුතු වේ. | සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ii) | ජාතික ප්‍රතිපත්තිවලට අනුව ඝන අපද්‍රව්‍ය වෙන් නොකිරීම් සිදුනොකර එකතු කර තිබුණි. | ඝන අපද්‍රව්‍ය වෙන්කිරීම් සිදුකර එකතු කළ යුතු වේ. | ක්‍රියාත්මක කිරීමට කටයුතු කරනු ලැබේ. |

(ඉ) **පාරිසරික ගැටලු**

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ඝන අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා තෝරාගෙන තිබූ ප්‍රදේශයේ මැසි මදුරුවන් බෝවීම මර්ධනය සඳහා මැසි තෙල් ඉසීම සහ දුර්ගන්ධය වැලැක්වීම සඳහා ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. | ඝන අපද්‍රව්‍ය බැහැර කිරිම් පිළිබඳ ක්‍රියාමාර්ග සිදු කළ යුතු වේ. | මදුරුවන් බෝවීම මර්ධනය කිරීමේ ක්‍රියාමාර්ග සිදුකරමින් පවතී. |

**3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහනගර සභාවේ භාවිතයේ පවතින අංක WPPB-9029 දරන වාහනය 2014 ජුනි 19 වන දින අනතුරට ලක් වීම සම්බන්ධයෙන් ආයතන සංග්‍රහයේ 2 කාණ්ඩයේ XLVIII(I) පරිශිෂ්ඨයේ ප්‍රකාරව කටයුතු කර නොතිබූ අතර සභා අරමුදලින් රු.1,958,200 ක් වැයකර අලුත්වැඩියා කර තිබුණි. | වාහන අනතුර සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අනතුර සම්බන්ධයෙන් විමර්ශනයන් සිදු කෙරෙමින් පවතී. |
| (ආ) | 2016 වර්ෂය තුලදී සභාවේ මහජන කළමනාකරණ සහායක විසින් රු.2,934,429 ක්වූ මුදල් වංචනිකව ලබාගෙන තිබුණි. එම මුදලින් රු. 320,000 ක් පමණක් ප්‍රතිපූරණය කරගෙන තිබුණි. ඉතිරි මුදල් රු.2,614,429 ක් මේ දක්වා අයකිරීමට මුදල් රෙගුලාසි 104 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | කලමනාකරණ සහකරු විසින් සිදුකළ වංචාව සම්බන්ධයෙන් අවසන් පියවර ගත යුතුය. | අදාළ පුද්ගලයාට එරෙහිව දිස්ත්‍රික් උසාවියේ නඩුව ක්‍රියාත්මක වෙමින් පවතී. |
| (ඇ) | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් නොකිරීමෙන් නගර සභාවට අයත් වැදගත් කාර්යයක් ඉටු නොවී පැවතුණි. | පළාත් පාලන සහකාරවරයා විසින් සකස් කළ යුතු වාර්තා නියමිත කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාල නිලධාරියාට මෙම කරුණ සම්බන්ධයෙන් උපදෙස් ලබාදී ඇත. |

| | | | |
|---|---|---|---|
| (ඈ) | සභාව විසින් සුළු ණයහිමියන්ට ගෙවිය යුතු වර්ෂ 2 සිට වර්ෂ 5කට අධික කාලයක සිට පවතින රු.87,121,179 ක් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි. | සුළු ණයහිමියන්ට ගෙවිය යුතු මුදල් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වේ. | සුළු ණයහිමියන් ගෙවා නිරවුල් කිරීමට කටයුතු කෙරේ. |
| (ඉ) | සභාව සතු කඩ කාමර 213 ක් පුද්ගලික පාර්ශව සමහ ගිවිසුම්ගතව බදු දී තිබුණි. ගිවිසුම් අංක 14, 23 සඳහන් කොන්දේසිවලට පටහැනිව බදු ලබාගත් අය විසින් වෙනත් අයට කඩ කාමර ලබා දී තිබූ අතර බදු කාලය අවසන් වීමෙන් පසුව නැවත ලංසු කැඳවීමෙන් තොරව ගිවිසුම් අලුත් කර තිබුණි. මෙය බදු ආදායම් රැස්කිරීමේ අකාර්යක්ෂමතාවය නිරුපනය කෙරේ. | කඩ කාමර බදු ගිවිසුම් නියමිත කාලයේ අලුත් කිරීමට කටයුතු කළ යුතුය. | සුදුසු ක්‍රියාමාර්ග ගෙන ඇත. |
| (ඊ) | සමාලෝචිත වර්ෂයේ සලසා තිබූ ප්‍රතිපාදන සහ පුස්තකාල අරමුදල් ප්‍රතිපාදන පිළිවෙලින් රු.94,611,105 ක් සහ රු.124,585,225 ක් කිසිඳු අරමුණක් සඳහා භාවිතා කර නොතිබුණි. | අදාළ ප්‍රතිපාදන එම අරමුණු සඳහා භාවිතා කළ යුතුය. | මෙය සභාවේ ආයෝජන ලෙස සැලකෙන අතර අවශ්‍යතාවය අනුව භාවිතා කෙරේ. |
| (උ) | නාගරික සංවර්ධන අධිකාරියේ අරමුදල් රු.15,915,143 ක් පැවතුණි. මෙම ප්‍රතිපාදන මෙම වර්ෂයේ රු.1,983,463 කින් වැඩි වී තිබූ අතර කිසිඳු අරමුණක් සඳහා උපයෝජනය කර නොතිබුණි. | අදාළ ප්‍රතිපාදන එම අරමුණු සඳහා භාවිතා කළ යුතුය. | මෙය සභාවේ ආයෝජන ලෙස සැලකෙන අතර අවශ්‍යතාවය අනුව භාවිතා කෙරේ. |

### 3.3 මානව සම්පත් කළමනාකරණය

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාව විසින් මානව සම්පත් ලබාගෙන යෙදවීම සිදුකර නොතිබූ බැවින්, එවැනි මානව සම්පත් 189 ක් විසින් නිමකළයුතු කාර්යයන් ප්‍රමාදවී තිබුණි. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කළ යුතු වේ. | තනතුරු පුරප්පාඩු පිරවීමට කටයුතු කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (ආ) | මහනගර සභාවේ ලැයිස්තුගත කළ තනතුරු 25 ක නිලධාරීන් පසුගිය වර්ෂ 7 – 30 දක්වා කාලපරිච්ඡේදයේ ස්ථාන මාරු වීම් නොලබා මහානගර සභාවේම රාජකාරී කර තිබීම මානව සම්පත් කළමනාකරණයක් බව නිරූපනය කෙරුණි. | අදාළ විධිවිධාන අනුව ස්ථාන මාරු වීම් සිදුකළ යුතුය. | අදාළ කටයුතු කෙරෙමින් පවතී. |
| (ඇ) | මහනගර සභාව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා නොගෙන සෞඛ්‍ය කම්කරුවන් 10 දෙනෙකුට පත් වීම් ලබා දී තිබුණි. | අදාළ තනතුරු සඳහා විධිමත් අනුමැතීන් ලබාගත යුතුය. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවට අමතර මානව සම්පත් වැඩි කිරීම සඳහා අනුමැතියට යවා ඇත. |
| (ඈ) | විදුලි කාර්මික පත්වීම් - 2013 සම්බන්ධයෙන් 2016 සැප්තැම්බර් 30 දිනැති අංක NN/JF/B/MC/2015/11 දරන විගණන විමසුම නිකුත් කර තිබූ නමුත් ඒ අනුව අධ්‍යාපන සුදුසුකම් නොමැති විදුලි කාර්මික තිදෙනෙකුට එරෙහිව කටයුතු කර තිබූ අතර සේවා සුදුසුකම් නොමැති 4 දෙනෙකුට එරෙහිය කිසිඳු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අදාළ පත් වීම් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |

### 3.4 වත්කම් කළමනාකරණය

#### 3.4.1 නඩත්තුව හා අලුත්වැඩියා නොකිරීම

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සභාවට අයත් වාහන 10 ක් දිගුකාලයක සිට අලුත්වැඩියා නොකළ තත්ත්වයේ වාහන අංගනයේ පැවතුණි. | වාහන අලුත්වැඩියා කිරීමට කටයුතු කළ යුතු වේ. | අදාළ ක්‍රියාමාර්ග ගනිමින් පවතී. |
| (ආ) | සභා බල ප්‍රදේශයේ කසළ රැස්කිරීම සඳහා ට්‍රැක්ටර් කුලියට යොදවා රු.12,410,165 ක් ගෙවීම් කර තිබුණි. එලෙසම සභාවේ | මහනගර සභාවට අයත් ට්‍රැක්ටර් අලුත්වැඩියා කර භාවිතයට ගත යුතුය. | ට්‍රැක්ටර් අලුත්වැඩියා කරමින් පවතින අතර පියවරෙන් පියවර කුලියට ලබාගත් |

| | |
|---|---|
| ට්‍රැක්ටර් 12 ක් අලුත්වැඩියා තත්ත්වයේ පවතී. ඒවා අලුත්වැඩියා කර භාවිතයට නොගෙන කුලියට ලබාගෙන තිබුණි. | ට්‍රැක්ටර් භාවිතය අඩු කරමින් පවතී. |

## 3.5 අනාර්ථික ගණුදෙනු

---------------------

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | මහනගර සභාවේ අරමුදල් භාවිතා කර රු.628,000 ක් වටිනා ලැප්ටොප් පරිගණකයක් සභාපතිවරයාගේ අවශ්‍යතාවයට මිලදී ගෙන තිබුණි. එම මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.2, 6.3.3 (ආ) මාර්ගෝපදේශවලට පටහැනිව මිලදී ගැනීම් සිදු වී තිබුණි. අදාළ වටිනාකමට වූ ලැප්ටොප් පරිගණකය සභාපතිවරයා වෙනුවෙන් මිලදී ගැනීමට ඇති අවශ්‍යතාවය විගණනයේදී තහවුරු කරගත නොහැකි වූ අතර අනාර්ථික වියදමක් ලෙසද පැවතුණි. | අදාළ ලැප්ටොප් පරිගණකය මිලදී ගැනීමේ අවශ්‍යතාවය තහවුරු කළ යුතු වේ. | ගෞරව මහනගර සභා සභාපතිවරයාගේ ගෞරවය ආරක්ෂා වන පරිදි ඔහුගේ ඉල්ලීම ඉටු කළ යුතුය යන පදනමින් සභාව තීරණය කර තිබුණි. |
| (ආ) | මහනගර සභාව නල්ලූර් උත්සවයේදී නල්ලූර් පරිසරය පිරිසිදු කිරීමේ කාර්යය සඳහා ස්ථිර සෞඛ්‍ය කම්කරුවන් 334 දෙනෙකුත් වැඩ බලන සෞඛ්‍ය කම්කරුවන් 141 දෙනෙකුත් අමතරව කම්කරුවන් 406 දෙනෙකුත් පැවති නමුත් කොන්ත්‍රාත් පදනමින් සෞඛ්‍ය කම්කරුවන් 40 දෙනෙකු අනුයුක්ත කර රු.1,620,000 ක් ගෙවීම් කර තිබුණි. අදාළ කම්කරුවන් උත්සව කාලයේදී සක්‍රීය ආකාරයෙන් උපයෝජනය කොට පරිසරය පිරිසිදු කිරීමේ කාර්යයන් ඉටු කළ හැකි වුවත් එලෙස සිදු නොකිරීමෙන් අනාර්ථික වියදමක් උද්ගත වුණි. | නල්ලූර් සමය සඳහා කොන්ත්‍රාත් පදනමින් සෞඛ්‍ය කම්කරුවන් පත්කර නොගෙන මහනගර සභාවේ සෞඛ්‍ය කම්කරුවන් යෙදවිය යුතුය. | සභාවේ තීරණ අනුව තාවකාලික පත්වීම් ලබා දී තිබුණි. |
| (ඇ) | පළාත් නිශ්චිත සංවර්ධන සහනාධාර අරමුදල් භාවිතා කර රු.35,000,000 ක් වටිනා වීදි විදුලි පහන් 2208 ක් සවිකිරීම සඳහා මිලදී ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.2.2 සහ පළාත් මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.8 හි සඳහන් මාර්ගෝපදේශයන්ට | අදාළ මිලදී ගැනීම්වලදී නියමිත ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතු වේ. | මහනගර සභාවේ ව්‍යවස්ථාව අනුව ප්‍රසම්පාදන සම්බන්ධයෙන් තීරණ මූල්‍ය කමිටුව විසින් අනුමත කළ යුතුය. පළාත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 4.2.8 ට අනුකූලව වෙනත් |

| | | |
|---|---|---|
| පටහැනිව හා ප්‍රසම්පාදන තීරණ ඉටු නොකර සැපයුම්කරුවන් තේරීම් සිදු වී තිබුණි. එසේම අදාළ වීදි විදුලි පහන් සවිකිරීමේදී අලුතින් සවිකළ විදුලි පහන් 213 ක් ඉවත් කිරීම නිසා රු.376,995 ක් අනාර්ථික වියදමක් ලෙස සැලකුණි. | | දෙපාර්තමේන්තු නිලධාරීන් පත්කර නොතිබුණි. ඉවත්කළ විදුලි පහන් නැවතත් වෙනත් ස්ථානයක සවිකිරීමට ක්‍රියාමාර්ග ගෙන ඇත. |

**3.6 ප්‍රසම්පාදනය**

---------------

**3.6.1 ප්‍රසම්පාදන සැලැස්ම**

------------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------------- | ---------------------------- |
| සමාලෝචිත වර්ෂය සඳහා ප්‍රසම්පාදන සැලැස්ම ප්‍රාදේශීය සභාව විසින් භාණ්ඩ හා සේවා සහ ගිවිසුම්ගත සේවාවන් සඳහා ක්‍රියාකාරකම් සඳහා සකස් කළ යුතු වේ. එසේ වුවත්, ගිවිසුම්ගත සේවාවන් සඳහා ප්‍රසම්පාදන සැලැස්ම සකස් කර නොතිබුණි. | ප්‍රසම්පාදන සැලැස්ම අනුමත ආකෘතියට අනුව සකස් කළ යුතුය. | වෙන් වෙන් වශයෙන් සැපයුම් සඳහාත්, සේවාවන්, ගිවිසුම්ගත කාර්යයන් සඳහාත් ප්‍රසම්පාදන සැලැස්ම සකස් කරමින් පවතී. |

**3.6.2 භාණ්ඩ හා සේවා**

----------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------------- | ---------------------------- |
| පළාත් නිශ්චිත සංවර්ධන සහනාධාර අරමුදල් මඟින් රු.2,580,000 ක් වටිනා ට්‍රේලර් 06 ක් මිලදී ගැනීමේදී 2006 ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 1.2.1, 6.2.2, 2.5, 2.6 මාර්ගෝපදේශයන්ට පටහැනිව මිලදී ගැනීම් සිදුකර තිබුණි. | අදාළ මිලදී ගැනීමේදී නියමිත ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටීන් අනුගමනය කළ යුතුය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ 6.2.2 ට අනුව දින 21 ක කාල අවකාශයක් නොමැති නිසා දින 14 ක කාල අවකාශයක් ලබා දී ලංසු කැඳවීම් පුවත්පත් 02 ක ප්‍රචාරණය කර තිබුණි. |

**4. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය**

-------------------------------------

**4.1 අයවැය පාලනය**

------------------

| විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| ----------------------- | ----------------- | ---------------------------- |
| සභාවේ ඇස්තමේන්තුගත පුනරාවර්තන වියදම් හා තථ්‍ය පුනරාවර්තන වියදම් සමඟ | අයවැය නිවැරදි ආකාරයෙන් සැලසුම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග | සේවක පුරප්පාඩු පුරවා නොමැති බැවින් හා වියදම්වල අනාර්ථික බව හේතුවෙන් මෙම වෙනස්කම් සිදු වී |

| | | |
|---|---|---|
| සැසඳීමේදී රු.106,498,129 කින් හිතකර ලෙස බලපා තිබුණි. | ගත යුතු වේ. | තිබේ. |

**4.2** **අභ්‍යන්තර පාලනය**

| විගණන නිරීක්ෂණ | නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව ක විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර නොතිබුණි. | අදාල වාර්තා විගණනයට ඉදිරිපත් කළ යුතුවේ. | ඉදිරි කාලයේදී අභ්‍යන්තර විගණන වාර්තා පිටපත් ඔබ වෙත ඉදිරිපත් කරනු ලැබේ. |

**4.3** **නිරවුල් නොකළ විගණන නිරීක්ෂණ හා පිළිතුරු නොලත් විගණන විමසුම්**

| | විගණන නිරීක්ෂණ | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | අංක එන්එන්/අයිඑච්/පී/2015(10) දරන 2015 සැප්තැම්බර් 30 දිනැති කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන තිබූ පශු ශල්‍ය වෛද්‍ය නිලධාරී යන මාතෘකාව යටතේ විගණන විමසුම නිකුත් කර ඇති අතර 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ විගණන වාර්තාවලින් ද සඳහන් කර තිබුණි. මෙම ගෙවීම් නීතිවිරෝධී වන අතර විගණනයේදී අනුමත කළ නොහැකි විය. | අදාල විගණන විමසුම් සඳහා පිළිතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. | විමර්ශන කමිටුවේ වාර්තාව ලැබූ විගස සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |
| (ආ) | අංක එන්එන්/අයිඑච්/පී/එම්සී/2015(02) දරන 2015 ඔක්තෝබර් 12 දිනැති කොන්ත්‍රාත් පදනමින් බඳවාගත් ඉංජිනේරු පත්වීම සඳහා අනුමත නොවූ වැටුප්, ප්‍රවාහන වියදම් රු.750,791 යන මාතෘකාව යටතේ විගණන විමසුම නිකුත් කර ඇති අතර 2014 වර්ෂයේ සිට 2017 වර්ෂය දක්වා වූ විගණන වාර්තාවලින් ද සඳහන් කර තිබුණි. | අදාල විගණන විමසුම් සඳහා පිළිතුරු විගණනයට ඉදිරිපත් කළ යුතුය. | විමර්ශන කමිටුවේ වාර්තාව ලැබූ විගස සුදුසු ක්‍රියාමාර්ග ගනු ලැබේ. |